# මිකායෙල්, ගාබ්‍රියෙල් සහ රෆායෙල් අග්‍රදූතයෝ
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය දානියෙල් 7: 9-10, 13-14

*දානියෙල් දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.*

"කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත පිරිසක් පෞරාණිකයාණන් වහන්සේ ඉදිරියෙහි සිටියහ."

"මා බලා සිටිය දී, සිංහාසන පිහිටුවන ලදුව පෞරාණිකයාණෝ අසුන් ගත්හ. උන් වහන්සේගේ වසත්‍ර හිම මෙන් සුදු ය: හිසකේ පිරිසිදු ලොම් මෙන් සුදු ය: උන් වහන්සේගේ සිංහාසනය ගිනි ජාලාවකි. එහි රෝද ඇවිළෙන ගිනි ය. ගිනිමය ගංගාවක් උන් වහන්සේ ඉදිරියෙන් ගලා ගෙන ගියේ ය. ලක්ෂ සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේට උපස්ථාන කළහ. කෝටි ප්‍රකෝටි සංඛ්‍යාත පිරිසක් උන් වහන්සේ ඉදිරියේ සිටියහ. අධිකරණ සභාව අසුන් ගත්තා ය. පොත් දිගඅරින ලද්දේ ය.

තවදුරටත් බලා සිටිය දී මම රාත්‍රි දර්ශනවල දී මෙසේ දිටිමි. මනුෂ්‍ය-පුත්‍රයා වැනි කෙනෙක් අහසේ වලාකුළු පිරිවරා අවුත් පෞරාණිකයාණන් වෙත එළඹුණේ ය. උන් වහන්සේ පෞරාණිකයාණන් වෙත පමුණුවනු ලැබූ සේක. සියලු ජනයන් ද ජාතීන් ද භාෂාවන් ද උන් වහන්සේට සේවය කරන පිණිස පාලන බලය ද ගෞරවය ද රාජ්‍යය ද උන් වහන්සේට දෙන ලද්දේ ය. උන් වහන්සේ ගේ පාලනය පහ නොවන සදාකාලික පාලනයක් ය. උන් වහන්සේගේ රාජ්‍යය කිසිකාලෙක නැති නොවන්නේ ය."

*දේව වචනය මෙසේ ය.*

හෝ

## පළමුවන දේව ප්‍රකාශනය එළිදරව්ව 12: 7–12

*එළිදරව්ව පොතෙන් උපුටා ගත් කොටසකි.*

"මිකායෙල් හා ඔහුගේ දූතයෝ මකරාට විරුද්ධ ව සටන් කළහ."

"තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. මිකායෙල් හා ඔහුගේ දූතයෝ මකරාට විරුද්ධ ව සටන් කළහ. මකරා ද තමාගේ දූතයන් පිරිවරා සටන් කොට පරාජය විය. ඔවුන්ට ස්වර්ගයෙහි තැනක් තවත් නො වී ය. මහා මකරා පලවා හරින ලදි. ඔහු නම් මුළු ලොව රැවටූ යක්ෂයා හෙවත් සාතන් යයි නම් ලත්, ආදි සර්පයා ය. ඔහු සමඟ ඔහුගේ දූතයෝ ද පොළොවට හෙළනු ලැබුවෝ ය.

ඉන්පසු ස්වර්ගයෙහි මෙසේ කියන මහ හඬක් මට ඇසිණි: එනම්, "අපේ දෙවියන් වහන්සේගේ ගැළවීම ද බලය ද රාජ්‍යය ද ස්වකීය ක්‍රිස්තුන් වහන්සේගේ අධිපතිකම ද දැන් පැමිණ ඇත. මන්ද, අපේ දෙවියන් වහන්සේ ඉදිරියෙහි දිවා රෑ දෙක්හි අපගේ සහෝදරයන්ට චෝදනා කරන පැමිණිලිකාරයා පහතට හෙළන ලදි. ඔව්හු බැටළු පෝතකයාණන්ගේ යාගික රුධිරය නිසා ද, තමන් සාක්ෂි දැරූ පණිවුඩය නිසා ද ඔහුගෙන් ජය ගත්තෝ ය. මන්ද, ඔව්හු මරණයට වත් බිය නොවී දිවි දීමට සූදානම් ව සිටියහ. එබැවින් ස්වර්ගයෙනි, එහි වැසියෙනි, ප්‍රීති සන්තෝෂ වන්න. අහෝ! පොළොවටත් මුහුදටත් වන විපත! මන්ද, යක්ෂයා තමාට වැඩි කලක් නැති බව දැන, කෝපාවිෂ්ට ව, ඔබ වෙත බැස ගියේ ය" යනු යි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය

ගීතාවලිය 138: 1–5

පිළිතුර : සමිඳුනි, මගේ මුළු හදින් ඔබ වහන්සේට තුති පුදන්නෙමි.

ගීය : සමිඳුනි, හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි.
දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගී ගයා ඔබ පසසන්නෙමි.

ඔබේ ශුද්ධ මාලිගාව දෙස බලා නමස්කාර කරමින්
ඔබේ කරුණා ගුණය සහ විශ්වාසවන්තභාවය නිසා
ඔබේ නාමයට තුති පුදන්නෙමි.
ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව ඔබ පෙන්වූ සේක.

මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක:
තමාගේ සිත සවි කොට, මට ධෛර්යය දුන් සේක.
සමිඳුනි, මෙලොව සියලු රජවරු ඔබේ පොරොන්දු
ඇසූ බැවින් ඔබට තුති පුදන්නෝ ය.

එසේ ය, සමිඳුන්ගේ මහිමය උතුම් වන්නේ ය:
ඔව්හු සමිඳුන්ගේ මාර්ග ගැන ගී ගයන්නෝ ය.

## සුපුවත් ජය නද

ගීතාවලිය 103: 20

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන්ගේ අණ පිළිපදින සුර සේනා සියල්ලෙනි,
එතුමන් පසසන්න.
ආලේලූයා!

## සුවිශේෂය

ජොහන් 1: 47–51

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ස්වර්ගය විවර වී, මනුෂ්‍ය-පුත්‍රයාණන් වෙත දෙවියන් වහන්සේගේ දූතයන් නැග යනවාත් බැස එනවාත් ඔබ දකින්නෙහි ය."

ජේසුස් වහන්සේ නතානියෙල් තමන් වෙත එනු දැක, "මෙන්න, හොරබොරු නැති, සැබෑ ඉශ්රායෙල් ජාතිකයෙකු"යි ඔහු ගැන වදාළ සේක. "ඔබ මා ගැන කෙසේ දන්නෙහි දැ"යි නතානියෙල් උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "පිලිප් ඔබ කැඳවන්නටත් පෙර, අත්තික්කා ගස යට සිටිනු මම දිටිමි" යි වදාළ සේක.

නතානියෙල් උත්තර දෙමින්, "ගුරුදේවයෙනි, ඔබ වහන්සේ නම්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය: ඔබ වහන්සේ නම් ඉශ්රායෙල්හි රජිඳාණෝ ය"යි කී ය. ජේසුස් වහන්සේ ද පිළිතුරු දෙමින්, "ඔබ අත්තික්කා ගස යට සිටිනු මම දිටිමි, යි මා ඔබට වදාළ බැවින් ද, ඔබ අදහා ගත්තේ? මීට වඩා මහත් දේ ඔබ දකින්නෙහි ය" යි වදාළ සේක. තවදුරටත් උන් වහන්සේ කතා කරමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි: ස්වර්ගය විවර වී, මනුෂ්‍ය-පුත්‍රයාණන් වෙත දෙවියන් වහන්සේගේ දූතයන් නැග යනවාත්, බැස එනවාත් ඔබ දකින්නෙහි ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*